සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) උපකාරක තක්සේරුව - 2026
கல்விப் பொதுத் தராதர (சாதாரண தரம்) உதவித் மதிப்பீடு - 2026
Genaeral Certificate of Education (Adv. Level) Supportive Assesment - 2026

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II வணிக மற்றும் கணக்கியல் ஆய்வுகள் I, II **Business and Accounting Studies I, II**	**60**	**S**	**I,II**

පැය තුනයි
மூன்று மணி நேரம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

උපදෙස් :

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න .
* 1 සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති **(1), (2), (3), (4)** යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

- පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් අංක **01** සිට **05** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අමල් බහුදින ධීවර යාත්‍රා හිමිකරුවෙකි. ඔහු තම ධීවර යාත්‍රාවලින් රැගෙන එන මාළු විකිණීමේ ව්‍යාපාරයක් "ප්‍රෙෂ් ෆිෂ්" (Fresh Fish) නමින් ආරම්භ කරන ලදී. අමල් මෙම ව්‍යාපාරය තමාගේම ගොඩනැගිල්ලක පවත්වාගෙන යයි. වෙළෙඳසැලේ මාළු විකිණීමට අමතරව ඔහු ප්‍රදේශයේ "ගැමී රස" ආපනශාලා ජාලයට ද මාළු සැපයීම සිදු කරයි. අමල් තම ධීවර යාත්‍රා ධිවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති අතර ව්‍යාපාරය වෙනුවෙන් ප්‍රදේශයේ ධීවර සමූපකාර සමිතියෙන් ණය මුදලක්ද ලබා ගෙන ඇත.

1. "ප්‍රෙෂ් ෆිෂ්" ව්‍යාපාරය නිෂ්පාදිතයේ ස්වභාවය අනුව කුමන ව්‍යාපාර වර්ගයට අයත් වේද ?
(1) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි. (2) සේවා සැපයීමේ ව්‍යාපාරයකි.
(3) කේවල ස්වාමී ව්‍යාපාරයකි. (4) සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයකි.

(2) මෙම සිද්ධියේ සඳහන් පෞද්ගලික අංශයට අයත් ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාර සංවිධානය කුමක්ද?
(1) ප්‍රෙෂ් ෆිෂ් ව්‍යාපාරය (2) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
(3) ගැමී රස ආපන ශාලා ජාලය (4) ධීවර සමූපකාර සමිතිය

(3) "ප්‍රෙෂ් ෆිෂ්" ව්‍යාපාරය ගැමිරස ආපනශාලා ජාලයට විකුණන මාළු අයත් වන නිෂ්පාදන සාධකය වන්නේ,
(1) භූමිය (2) ශ්‍රමය (3) ප්‍රාග්ධනය (4) ව්‍යවසායකත්වය

(4) ධීවර සමූපකාර සමිතිය, "ප්‍රෙෂ් ෆිෂ්" ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතුවක් වන්නේ,
(1) ව්‍යාපාරයේ අනාගත වර්ධනය. (2) ආයෝජන පිළිබඳ තීරණ ගැනීම.
(3) රැකියා අවස්ථා උත්පාදනය කිරීම. (4) තවදුරටත් ණය සැපයීම.

(5) ඉහත සිදිධියට අනුව නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) "ප්‍රෙෂ් ෆිෂ්" ව්‍යාපාරය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ.
(2) "ගැමී රස" ව්‍යාපාරය, "ප්‍රෙෂ් ෆිෂ්" ව්‍යාපාරයේ ගනුදෙනුකරුවෙකි.
(3) ව්‍යාපාරය පවත්වා ගෙන යන ගොඩනැගිල්ල නිෂ්පාදන සාධකයක් වන භූමියට අයත් වේ.
(4) ධීවර සමූපකාර සමිතිය "ප්‍රෙෂ් ෆිෂ්" ව්‍යාපාරයට ශක්තියකි.

[දෙවැනි පිටුව බලන්න.]

Past Papers Wiki

(6) "සංචාරකයන්ගේ ආරක්ෂාව සහ පහසුකම් පුළුල් කිරීම සඳහා රජය පියවර ගෙන ඇත." යන ප්‍රකාශයෙහි ඇතුලත් ව්‍යාපාර පරිසර සාධකය වන්නේ,

(1) දේශපාලන පරිසරය (2) නෛතික පරිසරය
(3) ආර්ථික පරිසරය (4) ගෝලීය පරිසරය

- පහත සිද්ධිය ඇසුරෙන් අංක **7** සිට **9** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රවාහන සේවය දියුණු කිරීම වෙනුවෙන් නවීන "Metro Bus Sri Lanka" බස් රථ සේවය හඳුන්වා දී ඇත. මෙම බස් රථ සේවාව මාකුඹුර බහුකාර්ය ප්‍රවාහන මධ්‍යස්ථානයෙන් ආරම්භ වන අතර, LMT Go මෘදුකාංගය මඟින් බස් රථය ඇති ස්ථානය නිවසේ සිටම නිරීක්ෂණය කිරීමේ පහසුකම් ද සලසා ඇත. තවද වයස අවුරුදු 12ට අඩු දරුවන්ට මෙම බස් රථවල නොමිලේ ගමන් කිරීමට ද අවස්ථාව ලබා දී ඇත.

(7) ඉහත සිද්ධියේ සඳහන් "Metro Bus" අයත් වන ප්‍රවාහන මූලිකාංගය කුමක් ද?

(1) මාර්ගය (2) මාධ්‍යය (3) බලය (4) පර්යන්තය

(8) ඉහත සිද්ධියේ සඳහන් ප්‍රවාහන සේවාවට සම්බන්ධ පර්යන්තය කවරක් ද?

(1) මාකුඹුර බහුකාර්ය ප්‍රවාහන මධ්‍යස්ථානය (2) නිවස
(3) ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රවාහන සේවය (4) LMT Go මෘදුකාංගය

(9) වයස අවුරුදු 12ට අඩු දරුවන්ට නොමිලේ ගමන් කිරීමට ලබා දෙන අවස්ථාව අයත් වන අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යය කුමක් ද?

(1) ප්‍රවර්ධනය (2) මිල (3) ස්ථානය (4) නිෂ්පාදිතය

(10) තොග වෙළෙඳාම හා සිල්ලර වෙළෙඳාම වෙන්කර හඳුනා ගැනීම සඳහා බලපාන ප්‍රධාන සාධකය වන්නේ,

(1) භාණ්ඩයේ මිල ය. (2) භාණ්ඩ ප්‍රමාණය ය.
(3) මිලදී ගැනීමේ චේතනාව ය. (4) භාණ්ඩ වර්ග සංඛ්‍යාව ය.

(11) තැන්පතුව ඇපයට තබා තැන්පතුවෙන් යම් ප්‍රතිශතයක් ණය මුදලක් ලෙස ලබා ගැනීමට හැකියාව ඇති බැංකු ගිණුම් වර්ගය වන්නේ, පහත කවරක් ද?

(1) ජංගම ගිණුම (2) ස්ථාවර තැන්පතු ගිණුම
(3) ජ්‍යෙෂ්ඨ පුරවැසි ගිණුම (4) ඉතිරි කිරීමේ ගිණුම

(12) පහත වගුවේ සන්නිවේදන මාධ්‍ය ද, සන්නිවේදන ක්‍රම ද දක්වා ඇත.

සන්නිවේදන මාධ්‍ය	සන්නිවේදන ක්‍රම
1. වාචික	A. ඇසුරුම් සංකේත
2. ලිඛිත	B. දුරකථන සංවාද
3. විද්‍යුත්	C. චක්‍රලේඛ
4. සංඥා හා සලකුණු	D. සම්මන්ත්‍රණ

ඉහත සන්නිවේදන මාධ්‍ය තීරුව, සන්නිවේදන ක්‍රම තීරුව සමඟ අනුපිළිවෙලින් ගැලපූ විට නිවැරදි පිළිතුර වනුයේ, පහත කවරක් ද?

(1) A, B, C, D (2) D, C, B, A (3) D, C, A, B (4) C, A, B, D

(13) විදේශ වෙළෙඳාම සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය කුමක් ද?

(1) විදේශ වෙළෙඳාම යනු රටවල් එකක් හෝ කිහිපයක් අතර සිදුවන වෙළෙඳාම වේ.
(2) තම රට තුළ නිෂ්පාදනය නොවන භාණ්ඩ පරිභෝජනය කිරීමේ අවස්ථාව හිමි වේ.
(3) විදේශ වෙළෙඳාම මඟින් රටකට විදේශ විනිමය ඉපයිය හැකිය.
(4) කිසියම් රටක් විදේශීය රටකින් භාණ්ඩ තම රටට ගෙන්වීම අපනයනය වේ.

(14) ස්ථාවර ප්‍රතිශතයක් යටතේ පොළී ආදායමක් ලබා ගත හැකි ආයෝජන මාර්ගය වන්නේ,
(1) දේපළ මිලදී ගැනීමය.
(2) කොටස් වෙළෙඳපොලෙහි ආයෝජනය කිරීමය.
(3) භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනා කිරීමය.
(4) තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමය.

(15) වෙක්පත් රේඛනය සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
(1) වෙක්පතක මුහුණත හරහා සමාන්තර රේඛා දෙකක් ඇඳීම විශේෂ රේඛනය වේ.
(2) රේඛනය කරන ලද වෙක්පතට බැංකු කවුන්ටරයෙන් මුදල් ලබා ගත හැකිය.
(3) වෙක්පතක් රේඛනය මඟින් වෙක්පතෙහි සඳහන් මුදල නියමිත පුද්ගලයාටම ලැබීම තහවුරු කර ගත හැකිය.
(4) වෙක්පතක් රේඛනය කළ හැක්කේ අණකරුට පමණි.

(16) දේපළ රක්ෂණයේ වැදගත්කම වන්නේ,
(1) දේශීය මෙන් ම විදේශීය වෙළෙඳාම් කටයුතුවලදී ද උපකාරී වීම ය.
(2) ආයෝජන මාර්ගයක් ලෙස යොදා ගත හැකි වීම ය.
(3) මූල්‍ය ආයතනවලින් ණය ලබා ගැනීමේදී ඇපයක් ලෙස භාවිත කළ හැකිවීම ය.
(4) රක්ෂණය කරන ලද මුදලට අමතරව ප්‍රසාද දීමනා, පොළී ආදිය හිමි වීම ය.

(17) ගිණුම්කරණයේ ප්‍රධානතම අරමුණ වන්නේ,
(1) ව්‍යාපාරය ප්‍රමාණවත් ලාභයක් උපයා තිබේද යන්න දැන ගැනීම ය.
(2) ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්වය සතුටුදායකද යන්න දැන ගැනීම ය.
(3) ඇල්මැති පාර්ශ්වයන්ට තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම ය.
(4) නීතිමය අවශ්‍යතා ඉටු කිරීමට තොරතුරු සැපයීම ය.

(18) මෝටර් රථ විකිණීමේ නිරත ව්‍යාපාරයක ජංගම නොවන වත්කම් ලෙස සළකනු ලබන්නේ,
(1) ප්‍රදර්ශනාගාරයේ විකිණීමට තබා ඇති මෝටර් රථය ය.
(2) කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා මිලට ගත් මෝටර් රථය ය.
(3) අයිතිකරු තම පෞද්ගලික ප්‍රයෝජනයට යොදා ගන්නා මෝටර් රථය ය.
(4) විකුණා ඇති නමුත් තවමත් ප්‍රදර්ශනාගාරය තුළ පවතින මෝටර් රථය ය.

(19) වැඩිවීම හර අඩුවීම බැර යන ද්විත්ව සටහන් මූලධර්මය අදාළ වන ගිණුමක් වන්නේ,
(1) ප්‍රාග්ධන ගිණුම ය.
(2) ණයහිමි ගිණුම ය.
(3) ණයගැති ගිණුමය
(4) ලද වට්ටම් ගිණුම ය.

(20) සිල්වාගේ ව්‍යාපාරය රු. 80 000ක වෙළෙඳ බඩු තොගයක් ණයට ගැනීම සටහන් කිරීම සඳහා භාවිතා කරන මූලික සටහන් පොත හා මූලාශ්‍ර ලේඛනය දැක්වෙන වරණය කවරක් ද?
(1) මුදල් පොත හා ගෙවීම් වවුචරය
(2) පොදු ජ'නලය හා ගැණුම් ඉන්වොයිසිය
(3) ගැණුම් ජ'නලය හා ගෙවීම් වවුචරය
(4) ගැණුම් ජ'නලය හා ගැණුම් ඉන්වොයිසිය

(21) පහත දැක්වෙන මූලික පොත්වලින් ද්විත්ව කාර්යයක් ඉටු නොකරන මූලික පොත වන්නේ,
(1) බැංකු ගිණුම
(2) පොදු ජ'නලය
(3) සුළු මුදල් පොත
(4) මුදල් පොත

(22) පොත් අලෙවිසැලක විකුණුම් ජ'නලයේ සටහන් කරනු ලබන ගනුදෙනුව කුමක් ද?
(1) රු. 150 000ක පොත් තොගයක් අත්පිට මුදලට විකිණීම.
(2) රු. 60 000ක ව්‍යාපාරයේ ප්‍රයෝජනයට ගෙන තිබූ මේසයක් ණයට විකිණීම.
(3) රු. 120 000ක පොත් තොගයක් නාමලීට ණයට විකිණීම.
(4) ව්‍යාපාරයේ පරිහරණය කළ පරිගණකයක් අත්පිට විකිණීම.

(23) සහන්ගේ ව්‍යාපාරයට අදාළ තොරතුරු පහත දැක් වේ.

	රු.
ප්‍රාග්ධනය (2025.01.01 දිනට)	500 000
වසරට අදාළ ආදායම්	170 000
වසරට අදාළ වියදම්	140 000
අයිතිකරු යෙදූ අමතර ප්‍රාග්ධනය	60 000
ගැනිලි	5 000

2025.12.31 දිනට ව්‍යාපාරයේ හිමිකම කොපමණ ද?

(1) රු. 585 000 (2) රු. 675 000 (3) රු. 700 000 (4) 745 000

(24) ව්‍යාපාරයක රු. 50 000ක ණයහිමියන්, අයිතිකරුගේ පෞද්ගලික මුදලින් පියවී ය . එමඟින් ගිණුම්කරණ සමීකරණයට වන බලපෑම වන්නේ,

(1) වත්කම් අඩුවීම හා වගකීම් අඩුවීම යි.
(2) හිමිකම් අඩුවීම හා වගකීම් අඩුවීම යි.
(3) හිමිකම් වැඩිවීම හා වගකීම් අඩුවීම යි.
(4) වත්කම් අඩුවීම හා වගකීම් වැඩිවීම යි.

(25) ව්‍යාපාරයක 2026.03.31 දිනට සුළු මුදල් පොතේ ශේෂය රු. 500ක් විය. 2026.04.01 දින සිට සුළු මුදල් අග්‍රිමය රු. 2 000කින් වැඩි කිරීම නිසා එදින සුළු මුදල් ප්‍රතිපූරණය සඳහා රු. 4 500ක් ලැබුණි. 2026.04.01 දිනට සුළු මුදල් අග්‍රිමය කොපමණ ද?

(1) රු. 4 500 කි. (2) රු. 2 500 කි. (3) රු. 500 කි. (4) රු. 5 000 කි.

(26) මිහින්සා වෙළෙඳ ව්‍යාපාරය රු. 30 000ක බඩු තොගයක් රු. 50 000ට අත්පිට විකිණීමෙන්,

(1) ව්‍යාපාරයේ වත්කම් හා හිමිකම් රු.20 000 කින් වැඩි වේ.
(2) ව්‍යාපාරයේ වත්කම් හා හිමිකම් රු.40 000 කින් අඩු වේ.
(3) ව්‍යාපාරයේ වත්කම් හා හිමිකම් රු.50 000 කින් වැඩි වේ.
(4) ව්‍යාපාරයේ වත්කම් හා වගකීම් රු.20 000 කින් වැඩි වේ.

(27) චමෝද්ගේ ව්‍යාපාරයේ ණයගැතියෙකු වන බුද්ධිනීගෙන් රු. 100 000ක සම්පූර්ණ ණය මුදල පියවීමට රු. 95 000ක් ලැබුණි. මෙම ගනුදෙනුවට අදාළ නිවැරදි ද්විත්ව සටහන වන්නේ කවරක් ද?

(1)
මුදල් ගිණුම හර	රු. 95 000
බුද්ධිනීගේ ගිණුම බැර	රු. 95 000

(2)
මුදල් ගිණුම හර	රු. 95 000
මුදල් ගිණුම බැර	රු. 95 000

(3)
මුදල් ගිණුම හර	රු. 95 000
ලද විටම් ගිණුම හර	රු. 5 000
බුද්ධිනීගේ ගිණුම බැර	රු. 100 000

(4)
මුදල් ගිණුම හර	රු. 95 000
දුන් වට්ටම් ගිණුම හර	රු. 5 000
බුද්ධිනීගේ ගිණුම බැර	රු. 100 000

(28) 2026.03.31 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුම ගිණුමේ හර ශේෂය රු. 15 000 ක් වූ අතර එදිනට බැංකුවෙන් ලද බැංකු ප්‍රකාශනයේ වාසිදායක ශේෂය රු. 17 000ක් විය. එම වෙනසට හේතු වූ ගනුදෙනුව කවරක් ද?

(1) ස්ථාවර නියෝග අනුව බැංකුව ගෙවූ රක්ෂණ වාරිකය රු. 2 000
(2) තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවූ අමල්ගේ චෙක්පත රු. 2 000
(3) බැංකුවට ලැබී ඇති ණයගැති කමල්ගේ චෙක්පත රු. 2 000
(4) ව්‍යාපාරයට ලැබී තැන්පත් කර උපලබ්ධි වූ ණයගැති මාලිකාගේ චෙක්පත රු. 2 000

(29) පහත සඳහන් වැරදි අතුරෙන් ශේෂ පිරික්සුමේ අසමානතාවයට බලපාන අවස්ථාවකට උදාහරණයක් වන්නේ කවරක් ද?

(1) රු. 55 000ක ගැණුම් ඉන්වොයිසියක් මඟහැරීම.
(2) රු. 1 250ක ණයට විකුණුම් දෙවරක් මූලික සටහන් පොත්වල වාර්තා කිරීම.
(3) විකුණුම් ජ'නලයේ එකතුව රු. 5 000ක් අඩුවෙන් සටහන් කිරීම.
(4) ගොඩනැගිලි අලුත්වැඩියා කිරීමේ වියදම් රු. 4 000ක් ගොඩනැගිලි ගිණුමට සටහන් කිරීම.

(30) ලාභ අරමුණු කර නොගත් සංවිධානවල ආදායම් සහ වියදම් ගිණුම .....(1)..... පදනමට සහ ලැබීම් සහ ගෙවීම් ගිණුම .....(2)..... පදනමට පිළියෙල කරයි.

ඉහත (1) සහ (2) ස්ථානවලට අදාළ නිවැරදි යෙදුම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) උපචිත, උපචිත
(2) උපචිත, මුදල්
(3) මුදල්, උපචිත
(4) මුදල්, මුදල්

(31) ලාභ අරමුණු කර නොගත් සංවිධානයක ආදායම් ප්‍රකාශනයේ සටහන් කරන නමුත් ලැබීම් සහ ගෙවීම් ගිණුමේ සටහන් නොකරන අයිතමය කුමක්ද?

(1) ක්‍රීඩා උපකරණ ක්ෂය
(2) පරිත්‍යාග ලැබීම්
(3) සාමාජික මුදල් ආදායම්
(4) විදුලි වියදම්

- පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක **32** හා **33** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

තිමත් ප්‍රකාශකයන්ගේ 2026 මාර්තු 31න් අවසන් මාසය සඳහා නිෂ්පාදන පිරිවැයට අදාළ තොරතුරු පහත දැක් වේ.

	රු.
කඩදාසි සඳහා	50 000
මුද්‍රණ ශිල්ප වැටුප්	30 000
කතෘ භාගය	15 000
කළමනාකරුගේ වේතන	10 000
ගොඩනැගිලි කුලී	7 000
විදුලිය	3 000
ගෙනයාමේ කුලී	2 000

(32) තිමත් ප්‍රකාශනයගේ 2026 මාර්තු මාසය සඳහා ප්‍රාථමික පිරිවැය කීය ද?

(1) රු. 80 000
(2) රු. 95 000
(3) රු. 105 000
(4) රු. 115 000

(33) තිමත් ප්‍රකාශනයගේ 2026 මාර්තු මාසය සඳහා නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය කොපමණ ද?

(1) රු. 12 000
(2) රු. 25 000
(3) රු. 20 000
(4) රු. 35 000

- පහත සඳහන් තොරතුරු භාවිත කරමින් අංක **34** සිට **40** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2025.01.01 දින රුවන් විසින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. එම ව්‍යාපාරය 2025.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාළ තොරතුරු පහත දැක් වේ.

ආදායම්	රු.	වියදම්	රු.
විකුණුම් ආදායම්	760 000	ගැණුම්	430 000
ලද ආයෝජන ආදායම්	15 000	ණය පොළී ගෙවීම්	4 000
ලද වට්ටම්	3 000	ගොඩනැගිලි කුලී ගෙවීම්	100 000
		ගෙන ඒමේ කුලී	30 000

2025.12.31 දිනට වත්කම් හා වගකීම් කිහිපයක් පහත දැක් වේ.

2025.12.31 දිනට වත්කම්	රු.	2025.12.31 දිනට වගකීම්	රු.
තොගය	35 000	8% බැංකු ණය (25/07/01)	200 000
ණය ගැතියෝ	38 000	ණයහිමියෝ	32 000
මුදල්	10 000		
යන්ත්‍ර හා උපකරණ (පිරිවැය)	400 000		
15% ආයෝජන	150 000		

අතිරේක තොරතුරු :

(1) මාසිකව රු.10 000ක කුලී ගෙවීමේ පදනම මත ගොඩනැගිල්ල කුලියට ගෙන ඇත.
(2) ව්‍යාපාරය සතු යන්ත්‍ර හා උපකරණ වාර්ෂිකව සරල මාර්ග ක්‍රමය මත 10% බැගින් ක්ෂය කළ යුතු ය.

(34) රුවන්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය කොපමණ ද?
(1) රු. 395 000 (2) රු. 425 000 (3) රු. 430 000 (4) රු. 460 000

(35) රුවන්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා දළ ලාභය කොපමණ ද?
(1) රු. 335 000 (2) රු. 365 000 (3) රු. 425 000 (4) රු. 460 000

(36) 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රුවන්ගේ ව්‍යාපාරයේ වෙනත් ආදායම් කොපමණ ද?
(1) රු. 15 000 (2) රු. 18 000 (3) රු. 22 500 (4) රු. 25 500

(37) 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය තුළ ව්‍යාපාරයේ පරිපාලන වියදම් තුළ සටහන් කළ යුතු වියදම්වල එකතුව කීය ද ?
(1) රු. 130 000 (2) රු. 140 000 (3) රු. 160 000 (4) රු. 170 000

(38) රුවන්ගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ සටහන් කළ යුතු ජංගම වගකීම්වල මුළු එකතුව කීය ද?
(1) රු. 24 000 (2) රු. 52 000 (3) රු. 56 000 (4) රු. 232 000

(39) 2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ දැක්විය යුතු ජංගම වත්කම්වල මුළු එකතුව කොපමණ ද?
(1) රු. 83 000 (2) රු. 90 500 (3) රු. 240 500 (4) රු. 640 500

(40) 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා රුවන්ගේ ව්‍යාපාරයේ ශුද්ධ ලාභය කොපමණ ද?
(1) රු. 167 500 (2) රු. 192 500 (3) රු. 232 500 (4) රු. 257 500

**

සියලු ම හිමිකම් ඇවිරිණි / *முழுப் பதிப்புரிமையுடையது* /All Rights Reserved

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி, உயர்கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education, Higher Education and Vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) උපකාරක තක්සේරුව - 2026
கல்விப் பொதுத் தராதர (சாதாரண தரம்) உதவித் மதிப்பீடு - 2026
Genaeral Certificate of Education (Adv. Level) Supportive Assesment - 2026

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
வணிக மற்றும் கணக்கியல் ஆய்வுகள் **I, II**
Business and Accounting Studies I, II

60 | **S** | **I,II**

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

උපදෙස් :

* **පළමුවන** ප්‍රශ්නය ඇතුළුව **I කොටසෙන්** ප්‍රශ්න **දෙකක් ද, II කොටසෙන්** ප්‍රශ්න **දෙකක් ද** බැගින් තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න .

1. පහත සිද්ධිය ඇසුරෙන් අංක (i) සිට (x) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

'GPS' නාක්ෂණය ප්‍රචලිත වී ඇති අවධියක ඒ පිළිබඳ උපාධියක් හදාරා ඇති සයුරු වෙත්තසිංහ තම දැනුම උපයෝගි කර ගනිමින් වර්තමානයේ ඉහළ ඉල්ලුමක් පවතින කුලිරථ ඇණවුම් කිරීමේ ඩිජිටල් ප්‍රවාහන සේවාවක් ආරම්භ කිරීමට අදහස් කළේය. ඔහු තම පාසල් මිතුරකු වන මියුරු කුමාරසිංහ ද ඊට සම්බන්ධ කර ගත් අතර 2026.08.01 දින 'ක්වික් රයිඩර්ස්' (Quick Riders) නමින් එම ව්‍යාපාරය ආරම්භ කරන ලදී.

2026.08.01 දින දෙදනා මුදලින් රු. 500 000 බැගින් ව්‍යාපාරයට යෙදූ අතර වාර්ෂිකව 10% පොලියට රු. 300 000 බැංකු ණයක් ද ලබා ගන්නා ලදී. එදිනම රු. 200 000ක් වටිනා තාක්ෂණික උපකරණ මිල දී ගත් අතර මියුරු සතුව තිබූ රු. 600 000ක් වටිනා ත්‍රීරෝද රථය ද ව්‍යාපාරයට යොදවන ලදී.

ව්‍යාපාරය කුලියට ගත් ගොඩනැගිල්ලක පවත්වා ගෙන යයි. ව්‍යාපාරයේ මෙහෙයුම් කටයුතු සඳහා රු. 35 000ක මාසික වැටුපකට පුහුණු සේවකයෙකු බඳවා ගන්නා ලදී. වට්ස් ඇප් (Whatsapp) මුහුණු පොත (Facebook) වැනි සමාජ මාධ්‍ය ජාලා භාවිතා කරමින් ව්‍යාපාරයේ ප්‍රචාරණ කටයුතු සිදු කරනු ලබන අතර, පාරිභෝගිකයින්ට සාධාරණ මිලකට ගුණාත්මක සේවාවක් සැපයීම තුළින් ලාභ ඉපැයීම සයුරු හා මියුරුගේ අපේක්ෂාව වේ.

සෑම දිනකම අවසානයේ ව්‍යාපාර කටයුතු සැලසුම් කළ ආකාරයට සිදුවන්නේ ද සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් සයුරු විසින් සිදු කරනු ලබයි.
කුලී රථ ලියාපදිංචි කිරීමෙන් ලැබෙන මුදල් ව්‍යාපාරයේ ආදායමක් වන අතර අගෝස්තු මාසයේ කුලී රථ ලියාපදිංචිය පිලිබඳ තොරතුරු පහත දැක් වේ.

වාහන වර්ගය	වාහන සංඛ්‍යාව	එක් වාහනයක ලියාපදිංචි ගාස්තුව (රු.)
ත්‍රීවිල් රථ	20	2500
කාර්	10	4000
මෝටර් බයිසිකල්	30	2000

අගෝස්තු මාසය තුළ මුදලින් සිදු වූ ගනුදෙනු පහත දැක් වේ.

	රු.
අන්තර්ජාල හා දුරකථන ගාස්තු ගෙවීම්	25 000
ගොඩනැගිලි කුලී ගෙවීම්	35 000
විදුලි වියදම් ගෙවීම්	15 000
ප්‍රචාරණ වියදම් ගෙවීම්	20 000
බැංකු ණය පොළී ගෙවීම්	2 500
කුලී රථ රියදුරන්ගෙන් කොමිස් ආදායම් ලැබීම්	400 000

අමතර තොරතුරු :

- ව්‍යාපාරය සතු ත්‍රීවිල් රථය වාර්ෂිකව 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරයි.
- අගෝස්තු මාසයට අදාළ සේවක වැටුප් මෙතෙක් ගෙවා නොමැත.

(i) (අ) 'Quick Riders' ව්‍යාපාරය විසින් සපුරාලන මිනිස් අවශ්‍යතාව හා වුවමනාව ලියන්න.
(ආ) 'Quick Riders' ව්‍යාපාරය සතු ප්‍රධාන ව්‍යාපාර අරමුණු **දෙකක්** සිද්ධිය ඇසුරෙන් ලියන්න.

(ii) (අ) 'Quick Riders' ව්‍යාපාරය හිමිකාරිත්වය අනුව අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක්ද?
(ආ) ඔබ සඳහන් කළ ව්‍යාපාර සංවිධාන වර්ගයේ ලක්ෂණ **දෙකක්** ලියන්න.

(iii) (අ) 'Quick Riders' ව්‍යාපාරය සතු ශක්තියක් සහ අවස්ථාවක් සිද්ධිය ඇසුරෙන් ලියන්න.
(ආ) මෙම ව්‍යාපාරයේ භාවිතා කරන සන්නිවේදන මාධ්‍ය හා ඊට අදාළ සන්නිවේදන ක්‍රමය ලියන්න.

(iv) (අ) 'Quick Riders' ව්‍යාපාරයේ කළමනාකරණ කාර්යයක් නම්කර ඒ සඳහා සිද්ධිය ඇසුරෙන් නිදසුනක් ලියන්න.
(ආ) මෙම සිද්ධියේ සඳහන් අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයක් නම් කර ඊට උදාහරණයක් ලියන්න.

(v) 'Quick Riders' ව්‍යාපාරයේ 2026.08.01 දිනට ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිතව ලියා දක්වන්න.

(vi) 'Quick Riders' ව්‍යාපාරය පවත්වා ගෙන යන මූලික පොත් **දෙකක්** නම් කර ඊට අදාළ මූලාශ්‍ර ලේඛන නම් කරන්න.

(vii) උපචිත සේවක වැටුප් සටහන් කිරීමට අදාළ ජ'නල් සටහන ලියන්න.

(viii) 'Quick Riders' ව්‍යාපාරයේ 2026.08.31 දිනට මුදල් ශේෂය ගණනය කරන්න.

(ix) 'Quick Riders' ව්‍යාපාරයේ 2026.08.31 දිනට ජංගම නොවන වත්කම්වල ධාරණ අගය කොපමණද?

(x) 'Quick Riders' ව්‍යාපාරයේ 2026.08.31 දිනෙන් අවසන් මාසය සඳහා ශුද්ධ ලාභය ගණනය කරන්න.

(ලකුණු 2×10 = 20 යි)

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

2. (i) (අ) සමූපකාර සංවිධානයක දැකිය හැකි ලක්ෂණ **දෙකක්** ලියන්න.
(ආ) ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමෙන් ලබා ගත හැකි ප්‍රතිලාභ **දෙකක්** ලියන්න.

(ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වේගවත් වර්ධනය තුළින් මුළු ලෝකයම විශ්ව ගම්මානයක් බවට පත් වී ඇත.

(ආ) මිනිසුන්ට ජීවත් වීම සඳහා වුවමනා අනිවාර්යයෙන්ම සපුරා ගත යුතු වේ.

(ඉ) ආයතනයක තීරණ ගැනීම හා එම තීරණ ක්‍රියාත්මක කිරීම, සේවකයින්ගේ අපේක්ෂාවකි.

(ඊ) නව නගර නිර්මාණය තුළින් ව්‍යාපාර වලට අවස්ථා රාශියක් හිමි වේ.

(ලකුණු 02 යි)

(iii) සයුමි විසින්, සේවකයෙකුගේ සහය ඇතිව දිරාපත් වන කසල භාවිතයෙන් කාබනික පොහොර සකසා විකිණීමේ ව්‍යාපාරයක් "ඕගනික්" නමින් ආරම්භ කර වෙනත් කාබනික පොහොර නිෂ්පාදකයින්ට හොඳ අභියෝගයක් එල්ල කරමින් තමන්ගේම ගොඩනැගිල්ලක ව්‍යාපාරය පවත්වා ගෙන යයි.

PAST PAPERS WIKI

(අ) ඉහත සිද්ධියට අනුව "ඕගනික්" ව්‍යාපාරයේ නිෂ්පාදන සාධක **දෙකක්** උදාහරණ සහිතව ලියන්න.

(ලකුණු 01 යි)

(ආ) ඉහත සිද්ධිය තුළින් ගම්‍ය වන ඇලිමැති පාර්ශ්වයන් **දෙකක්** උදාහරණ සහිතව ලියන්න.

(ලකුණු 01 යි)

(iv) පහත වගුව පිටපත් කරගෙන දී ඇති ව්‍යාපාර සංවිධාන සඳහා අදාළ ලක්ෂණ ඒ ඒ නිර්ණායක යටතේ ලියා දක්වන්න.

නිර්ණායක / ව්‍යාපාර සංවිධාන	අඛණ්ඩ පැවැත්ම	ප්‍රාග්ධනය සපයා ගැනීම	නෛතික පුද්ගලභාවය	වගකීම
සීමා සහිත සමාගම්				
රාජ්‍ය සංස්ථා				

(ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

3. (i) වෙළඳාමේ ප්‍රභේද නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද දක්වන්න.

(අ) ඒකකයක සිල්ලර මිලට සාපේක්ෂව තොග මිල වැඩි ය.

(ආ) වාණිජ බැංකුවල පවත්වා ගෙන යනු ලබන ඉතිරි කිරීමේ හා ජංගම ගිණුම් සඳහා ප්‍රතිලාභය ලෙස පොළී ආදායම හිමි වේ.

(ඉ) චෙක්පතක් පිටසන් කිරීම තුළින් එම චෙක්පත පිළිබඳ අව්‍යාජ හිමිකමක් තහවුරු වේ.

(ඊ) හරපතකින් ගනුදෙනු කිරීම සඳහා බැංකු ගිණුමක් තිබීම අත්‍යවශ්‍ය වේ.

(ලකුණු 02 යි)

(iii) කමල් සිරිවර්ධන ශ්‍රී ලංකා රක්ෂණ සමාගමෙන් ජීවිත රක්ෂණ ඔප්පුවක් ලබා ගෙන ඇත. එහිදී ඔහු අධිරුධිර පීඩන රෝගය සඳහා දිනපතා ඖෂධ ලබා ගන්නා නමුත් ඒ පිළිබඳව රක්ෂණ සමාගමට තොරතුරු ලබා දී නොතිබුණි.

(අ) ඉහත සිද්ධියේ සඳහන් රක්ෂණයට සම්බන්ධ පාර්ශ්ව දෙකක් උදාහරණ සහිතව දක්වන්න.

(ආ) ඉහත සිද්ධියට අනුව කඩවුණු රක්ෂණ මූලධර්මය නම් කර එය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 02 යි)

(iv) ව්‍යාපාරිකයෙක් වන සිරිතිලක වාණිජ බැංකුවක ගිණුමක් විවෘත කිරීමට සූදානම්ව සිටියි.

(අ) සිරිතිලකට විවෘත කිරීමට වඩාත් සුදුසු ගිණුම් වර්ගය නම් කරන්න.

(ආ) ඉහත ඔබ සඳහන් කළ ගිණුම් වර්ගය තුළින් ව්‍යාපාරිකයෙකුට ලැබෙන ප්‍රතිලාභ හතරක් ලියන්න.

(ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

4. (i) සඵලදායකත්වය හා කාර්යක්ෂමතාවය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02 යි)

(ii) පහත සඳහන් ප්‍රකාශ **සත්‍ය** ද **අසත්‍ය** ද යන්න දක්වන්න.

(අ) ව්‍යාපාරයකට අවශ්‍ය සම්පත් ලබා ගන්නා ආකාරය තීරණය කිරීම සංවිධානකරණය වේ.

(ආ) අන්තර්ජාලය හරහා සම්බන්ධ වන වෙළෙඳපල "වෙළෙඳපල අවකාශය" ලෙස හඳුන්වයි.

(ඉ) නිෂ්පාදිතයන්, පාරිභෝගිකයින් වෙත ලබා දීම හා සම්බන්ධ කටයුතු ප්‍රවර්ධනය ලෙස හැඳින් වේ.

(ඊ) කොටස් ගත් මිලට වඩා වැඩි වටිනාකමකට විකිණීමෙන් ලාභාංශ ආදායම් හිමි වේ.

(ලකුණු 02 යි)

(iii) පහත සඳහන් වන්නේ සචිනගේ නිමි ඇඳුම් අලෙවි කිරීමේ ව්‍යාපාරයේ කටයුතු කිහිපයකි.

A. - නිමි ඇඳුම් වෙළෙඳ සේවකයින් දෙදෙනෙකු බඳවා ගැනීමට තීරණය කරන ලදී.

B. - වෙළෙඳ සේවකයින් තුළින් ශ්‍රම ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා නිසි පෙළඹීම ලබා දීම.

C. - බඳවා ගත් සේවිකාවක් හට ළමා ඇඳුම් අංශයේ කටයුතු කිරීමට භාර දීම.

D. - සැලසුම් කළ පරිදි නිමි ඇඳුම් අලෙවි කර ඇති දැයි සෙවීම.

ඉහත සඳහන් එක් එක් කටයුතු තුළින් ගම්‍ය වන කළමනාකරණ කාර්යයන් පිළිවෙලින් ලියන්න.

(ලකුණු 02 යි)

(iv) වසන්ත විසින් ක්‍රන්ච් බිස්කට් සමාගමේ සාමාන්‍ය කොටස් 500ක්, එක් කොටසක් රු. 1 000 බැගින් මිලදී ගැනීමට සූදානම් වෙයි.

(අ) ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේදී සළකා බලන සාධක **දෙකක්** ලියන්න.

(ආ) සාමාන්‍ය කොටස්වල ආයෝජනය කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභ **හතරක්** ලියන්න.

(ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

5. (i) වගකීමක ලක්ෂණ **දෙකක්** ලියන්න. (ලකුණු 02 යි)

(ii) පහත එක් එක් ගිණුම අයත් වන ගිණුම් වර්ගය සඳහන් කරන්න.

(අ) ආයෝජන ගිණුම (ආ) බොල්ණය ගිණුම

(ඉ) ගැනිලි ගිණුම (ඊ) ලද වට්ටම් ගිණුම (ලකුණු 02 යි)

(iii) සනුකගේ ව්‍යාපාරයේ සිදු වූ ගනුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය පහත දැක් වේ.

ගනුදෙනු අංක	වත්කම්			හිමිකම් (රු.)	වගකීම්	
	බඩු තොග (රු.)	ණයගැතියෝ (රු.)	මුදල් (රු.)		ණය හිමියෝ (රු.)	බැංකු ණය (රු.)
(1)	+80 000				+80 000	
(2)	-50 000	+60 000		+ 10 000		
(3)			-100 000	-10 000		-90 000
(4)		-50 000	+50 000			

අවශ්‍ය වන්නේ :

(අ) ඉහත අංක (1) හා (2) ගනුදෙනු වටිනාකම් සහිතව ලිවීම. (ලකුණු 02 යි)

(ආ) ඉහත අංක (3) හා(4) ගනුදෙනුවලට අදාළ ද්විත්ව සටහන් ලියා දක්වන්න. (ලකුණු 02 යි)

(iv) ශේන්ගේ ව්‍යාපාරයේ 2026.01.01 දිනට පැවති ශේෂයන් පහත පරිදි වේ.

මුදල්	120 000
ණයහිමි - සුපුන්	100 000
ණයගැති - හසිත	60 000

2026 ජනවාරි මාසය තුළ සිදු වූ ගනුදෙනු පහත පරිදි වේ.

2026.01.02 - රු. 80 000ක ගොඩනැගිලි කුලී ආදායම් ලැබුණා.

2026.01.08 - ණයහිමි සුපුන්ට රු. 80 000ක ණය පියවීමේදී 10% වට්ටමක් ලැබුණා.

2026.01.12 - ණයගැති හසිතගෙන් ලද මුදල රු. 9 500 කි. දුන් වට්ටම රු. 500 කි.

2026.01.20 - අත්පිට විකුණුම් රු. 100 000 කි.

අවශ්‍ය වන්නේ:

(අ) ශේන්ගේ ව්‍යාපාරයේ වට්ටම් තීරු සහිත මුදල් පොත පිළියෙල කරන්න. (ලකුණු 02 යි)

(ආ) මුදල් පොතේ සටහන් කළ ගනුදෙනු පහත ගිණුම්වල සටහන් කර තුලනය කරන්න.

- ණයහිමි සුපුන්
- ණයගැති හසිත

(ලකුණු 02 යි)

(මුළු ලකුණු 12 යි)

6. (i) ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂයට වඩා බැංකු ප්‍රකාශනයේ ශේෂය අඩුවීමට බලපාන හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) සුමුදු චොක්ලට් නිෂ්පාදනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වා ගෙන යයි. 2026 මාර්තු මාසයට අදාළව චොක්ලට් නිෂ්පාදනයට අදාළ තොරතුරු කිහිපයක් පහත දී ඇත.

සෘජු ද්‍රව්‍ය	රු. 100 000
සෘජු වැටුප්	රු. 50 000
පරිභෝජනය කළ ද්‍රව්‍ය පිරිවැය	රු. 150 000
නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය	රු. 100 000
නිපද වූ ඒකක ගණන	පැකට් 1 000

අතිරේක තොරතුරු :

- නිෂ්පාදන ඒකකයක විකුණුම් මිල තීරණය කිරීමේ දී පිරිවැයට 20%ක ලාභාන්තිකයක් තබා ගැනීම ව්‍යාපාරයේ ප්‍රතිපත්තිය වේ .

අවශ්‍ය වන්නේ :

(අ) චොකලට් පැකට් එකක නිෂ්පාදන පිරිවැය

(ආ) චොකලට් පැකට් එකක විකුණුම් මිල

(ලකුණු 02 යි)

Past Papers Wiki

(iii) තරංගගේ ව්‍යාපාරයේ 2026.03.31 දිනට පිළියෙල කළ ශේෂ පිරික්සුම සමාන නොවූ අතර පසුව කරන ලද විමර්ශණයකදී පහත සඳහන් වැරදි අනාවරණය විය.

1. රු. 5 000ක විකුණුම් ඉන්වොයිසියක් මහහැරී ඇත.
2. ලද චෂ්ටම් රු. 1 000ක් දුන් චෂ්ටම් ගිණුමට හර කර ඇත.
3. ගෙවූ බැංකු ණය පොළී ගිණුමේ ශේෂය වූ රු. 500ක් ශේෂ පිරික්සුමෙන් මහහැරී ඇත.
4. රු. 5 000ක ණයට ගැණුම් රු. 15 000ක් ලෙස ගැණුම් ජ'නලයේ සටහන් කර ඇත.

අවශ්‍ය වන්නේ :

(අ) ඉහත වැරදි නිවැරදි කිරීමට අදාළ ජ'නල් සටහන්

(ආ) 2026.03.31 න් අවසන් දිනට ශේෂ පිරික්සුමේ පැවති වෙනස දක්වමින් අවිනිශ්චිත ගිණුම

(ලකුණු 04 යි)

(iv) රවීශගේ ව්‍යාපාරයේ 2026 මැයි මාසයට අදාළ බැංකු ගිණුම හා බැංකු ප්‍රකාශයට අදාළ තොරතුරු කිහිපයක් පහත දැක් වේ.

1. 2026.05.01 දිනට ව්‍යාපාරයේ බැංකු ගිණුමේ හා බැංකු ප්‍රකාශනයේ ශේෂය රු. 20 000 කි.
2. 2026 මැයි මාසයට අදාළව ව්‍යාපාරයේ බැංකු ගිණුමේ සටහන් වූ නමුත් බැංකු ප්‍රකාශයේ සටහන් නොවූ තොරතුරු
   - චෙක් අංක 857023 - ගැණුම් සඳහා නිකුත් කළ රු. 5 000ක චෙක්පත
   - චෙක් අංක 407258 - විකුණුම් සඳහා ලැබී තැන්පත් කළ රු. 15 000ක චෙක්පත
   - චෙක් අංක 857024 - විදුලිය සඳහා නිකුත් කළ රු. 2 500ක චෙක්පත
3. 2026 මැයි මස බැංකු ප්‍රකාශයේ සටහන් වූ නමුත් බැංකු ගිණුමේ සටහන් නොවූ තොරතුරු

බැංකු ගාස්තු	රු. 500
රක්ෂණ වාරික ගෙවීම	රු. 1 000
ණයගැති ප්‍රේෂණ	රු. 3 000

අවශ්‍ය වන්නේ :

(අ) 2026.05.31 දිනට රවීශගේ ව්‍යාපාරයේ බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කරන්න.

(ආ) 2026.05.31 දිනට රවීශගේ ව්‍යාපාරයේ බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කරන්න.

(ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

7. (i) සතිර ව්‍යාපාරයේ රු. 1 000 000 ක් 2025.01.01 දින ලංකා බැංකුවේ 10% ස්ථාවර තැම්පත් කල අතර 2025.12.31 දින වන විටත් ඊට අදාළ පොලී ආදායම ලැබී නොමැත.

අවශ්‍ය වන්නේ : (ලකුණු 02 යි)

පොලී ආදායම ගිණුම්ගත කිරීමට අදාළ ජර්නල සටහන දක්වන්න.

(ii) එකමුතු ක්‍රීඩා සමාජයේ සිටින සාමාජිකයින් සංඛ්‍යාව 200 කි. සාමාජිකයෙකුගෙ මාසික සාමාජික මුදල රු. 100 කි. 2025 වර්ෂය සඳහා සාමාජිකයින් 30 දෙනෙකු සාමාජික මුදල් ගෙවා නොමැත.

අවශ්‍ය වන්නේ :

(අ) 2025 වර්ෂය සඳහා මුදලින් ලද සාමාජික මුදල් වටිනාකම

(ආ) 2025.12.31න් අවසන් වර්ෂය සඳහා ආදායම් සහ වියදම් ගිණුමේ සටහන් කරන සාමාජික මුදල් වටිනාකම

(ලකුණු 02 යි)

(iii) තාරිකාගේ සිල්ලර වෙළෙඳ ව්‍යාපාරයේ 2025.12.31 දිනට පිළියෙල කල ශේෂ පිරික්සුම පහත දැක් වේ.

	හර (රු.)	**බැර (රු.)**
ගැණුම්	350 000	
විකුණුම්		680 000
ප්‍රාග්ධනය		530 000
තොගය (2025.01.01 දිනට)	42 000	
ණයගැතියෝ	55 000	
ණයහිමියෝ		40 000
මුදල් ශේෂය	8 500	

10% බැංකු ණය		80 000
දුන් වට්ටම්	9 000	
ලද වට්ටම්		8 000
බැංකු ශේෂය		3 000
බැංකු ණය පොළී	6 500	
ගොඩනැගිලි (පිරිවැය)	600 000	
බෙදාහැරීම් රථ (පිරිවැය)	450 000	
බැංකු ගාස්තු	2 000	
ගොඩනැගිලි ක්ෂය වෙන් කිරීම් (2025.01.01 දිනට)		150 000
බෙදාහැරීම් රථ ක්ෂය වෙන් කිරීම් (2025.01.01 දිනට)		75 000
බොල් ණය	15 000	
සේවක වැටුප්	28 000	
	1 566 000	1 566 000

අතිරේක තොරතුරු:

- 2025.12.31 දිනට ඉතිරි තොගය රු. 58 000 කි.
- ණයගැතියන්ගෙන් රු. 4 000ක බොල්ණය කපාහැරීමක් කළ යුතුය.
- ගොඩනැගිලි 10% ක් සහ බෙදාහැරීම් රථ 10% ක් වාර්ෂිකව සරල මාර්ග ක්‍රමය මත ක්ෂය කළ යුතුය.

අවශ්‍ය වන්නේ :

(අ) තාරිකාගේ ව්‍යාපාරයේ 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය

(ලකුණු 04 යි)

(ආ) 2025.12.31 දිනට තාරිකාගේ ව්‍යාපාරයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

(ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

***

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

1 කොටස

පිළිතුරු පත්‍රය

1.	2	11.	2	21.	2	31.	1
2.	4	12.	2	22.	3	32.	2
3.	3	13.	4	23.	1	33.	3
4.	4	14.	3	24.	3	34.	2
5.	2	15.	3	25.	4	35.	1
6.	1	16.	1	26.	1	36.	4
7.	2	17.	3	27.	4	37.	3
8.	1	18.	2	28.	3	38.	3
9.	1	19.	3	29.	3	39.	2
10.	3	20.	4	30.	2	40.	2

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

11 කොටස

පිළිතුරු පත්‍රය

1. (i) (අ) අවශ්‍යතාව - ප්‍රවාහනය **(ල. ½)**
වුවමනාව - ඩිජිටල් කුලී රථ සේවාව/ක්ෂණික මාර්ගගත කුලී රථ සේවාව**(ල. ½)**

(ආ) පාරිභෝගික තෘප්තිය ඉහළ නැංවීම/සාධාරණ මිලකට ගුණාත්මක සේවාවක් සැපයීම.
ලාභ ඉපයීම **(ල. ½ × 2 = 01)**

(ii) (අ)

- පෞද්ගලික අංශයේ හවුල් ව්‍යාපාර **(ල. 01)**
- අවට හවුල්කරුවන් සංඛ්‍යාව දෙකක් වන අතර උපරිමය විස්සක් වේ.
- හවුල්කරුවන්ගේ වගකීම අසීමිතය.
- ව්‍යාපාර ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ.
- නෛතික පුද්ගලභාවයක් නොමැත.
- අඛණ්ඩ පැවැත්මක් නොමැත. **(ල. ½ × 2 = 01)**

(iii) (අ) ශක්තිය : * මියුරු GPS තාක්ෂණය පිළිබඳ උපාධියක් හදාරා තිබීම.
*පුහුණු සේවකයෙකු සිටීම. (ල. ½)
අවස්ථාව: *ඩිජිටල් කුලී රථ සේවාව සඳහා ඉහළ ඉල්ලුමක් පැවතීම.
* GPS තාක්ෂණය ප්‍රචලිත වීම. **(ල. ½)**

(ආ) සන්නිවේදන මාධ්‍ය - විද්‍යුත් මාධ්‍ය
සන්නිවේදන ක්‍රමය - whatsapp, facebook සමාජ මාධ්‍ය ජාලා **(ල. ½)**

(iv) (අ) සංවිධානකරණය: සේවකයෙකු බඳවා ගැනීම.
තාක්ෂණික උපකරණ මිලට ගැනීම.
පාලනය: සෑම දිනකම අවසානයේ ව්‍යාපාර කටයුතු සැලසුම් කළ ආකාරයට සිදු වන්නේ දැයි සොයා බලා අවශ්‍ය නිවැරදි කිරීම් කිරීම.
(කාර්ය කිහෙ නම් ල. ½ උදාහරණය ල. ½)

(ආ) නිෂ්පාදිතය - ගුණාත්මක සේවාවක් ලබාදීම.
මිල - සාධාරණ මිලක් නියම කිරීම.
ප්‍රවර්ධනය - සමාජ ජාලා මඟින් ප්‍රචාරණය කිරීම.
(විවිධ කිහෙනම් ල. ½ උදාහරණය ල. ½)

(v)

	වත්කම්		=	හිමිකම්	+	වගකීම්
මුදල්	+	1 000 000	=	ප්‍රාග්ධනය රු. 1 000 000		
මුදල්	+	3 00 000	=	-	+	බැංකු ණය රු. 300 000
උපකරණ	+	200 000	=	-		-
මුදල්	-	200 000	=		+	-
ත්‍රිරෝද රථය	+	600 000	=	ප්‍රාග්ධනය රු. 600 000	+	
		රු. 1 900 000		රු. 1 600 000		රු. 300 000

(ල. 02)

(vi)

මූලාශ්‍ර පොත	මූලාශ්‍ර ලියවිල්ල
මුදල් පොත	ලදු පත, ගෙවීම් වවුචරය
පොදු ජ'නලය	ජ'නල් වවුචරය

(ල. 02)

(vii)

පොදු ජ'නලය

දිනය	වවුචර් අංකය	විස්තරය	ලෙ. පි	හර(රු)	බැර (රු)
2026.03.31		සේවක වැටුප් ගිණුම (හර) උපචිත සේවක වැටුප් ගිණුම (උපචිත සේවක වැටුප් ගිණුම්ගත කිරීම සටහන් කිරීම)		35 000	 35 000

(ල. 02)

(viii)

මුදල ගිණුම

ප්‍රාග්ධනය	1 000 000	තාක්ෂණික උපකරණ	200 000	
බැංකු ණය	300 000	අන්තර්ජාල හා දුරකථන	25 000	½
ලියාපදිංචි ආදායම	½150 000	ගොඩනැගිලි කුලි	35 000	
කොමිස් ආදායම	400 000	විදුලි වියදම	15 000	
		ප්‍රචාරණ වියදම	20 000	
		බැංකු ණය පොළි	2 500	½
		ශේෂය ප/ගෙ	1 552 500	
	1 850 000		1 850 000	
ශේෂය ඉ/ගෙ	1 552 500			

(නිවැරදි පිළිතුරට ලකුණු 02 නැතහොත් ල. ½×3=1 ½)

(ix)

	පිරිවැය (රු.)	සමුච්චිත ක්ෂය (රු.)	ධාරණ අගය (රු.)
ත්‍රී රෝද රථ	600 000	5 000 ½	595 000 ½
තාක්ෂණික උපකරණ	200 000	-	200 000 01
			795 000

පෙරවැඩ :

$$600\,000 \times \frac{10}{100} \times \frac{1}{12} = 5\,000$$

(ල. 02)

(x)

ආදායම්	රු.	රු.	
ලියාපදිංචි ගාස්තු ආදායම්	150 000		
කොමිස් ආදායම්	400 000	550 000	½
වියදම්			
අන්තර්ජාලය හා දුරකථන ගාස්තු	25 000		
ගොඩනැගිලි කුලි	35 000		
විදුලි වියදම්	15 000		
ප්‍රචාරණ වියදම්	20 000		
බැංකු ණය පොළී	2 500		
ත්‍රී රෝද රථ ක්ෂය	5 000 ½		
උපචිත සේවක වැටුප්	35 000 ½	(137 500)	
ශුද්ධ ලාභය		412 500	

(නිවැරදි පිළිතුරට ල. 02 නැතහොත් ල. ½×3=1 ½)

2.

(i) (අ) - ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් තිබීම.
- ස්වේච්ඡා හා විවෘත සාමාජිකත්වය
- සාමාජිකයන්ගේ සාමූහික අයිතිය
- පොදු අවශ්‍යතා හා අරමුණුවලින් යුක්ත වීම. **(මෙයින් 2 කට ල.01)**

(ආ) - ව්‍යාපාර නාමයේ අයිතිය තහවුරු වීම.
- අනන්‍යතාවයක් ලැබීම.
- රජයෙන් ලබාදෙන දිරිතැන්වීම් ලබාගැනීමට සුදුසුකමක් වීම.
- ණය ලබාගැනීමේදී පහසුවක් වීම. **(මෙයින් 2 කට ල.01)**

(ii) (අ) සත්‍යයි. (ආ) අසත්‍යයි. (ඉ) අසත්‍යයි. (ඊ) සත්‍යයි.

(ල. 02)

(iii) (අ) ප්‍රාග්ධනය - ගොඩනැගිල්ල
ශ්‍රමය - සේවකයාගේ සහාය
ව්‍යවසායකත්වය - තරඟකරුවන්ම අභියෝග කරමින් නිෂ්පාදන සාධක මෙහෙයවීම.
(මෙයින් 2 කට ල.01)

(ආ) සයුමි/ අයිතිකරු
තරඟකරු - පොහොර නිෂ්පාදකයින්
සේවකයා

(iv)

නිර්ණායක / ව්‍යාපාර සංවිධාන	අඛණ්ඩ පැවැත්ම	ප්‍රාග්ධනය සපයා ගැනීම	නෛතික පුද්ගලභාවය	වගකීම
සීමාසහිත සමාගම්	ඇත.	කොටස් නිකුතුවෙන් සපයා ගනියි.	ඇත.	සීමිතයි.
රාජ්‍ය සංස්ථා	ඇත.	රජය විසින් සපයයි.	ඇත.	අසීමිතයි.

3.

(i)



(ii) (අ) අසත්‍යයි. (ආ) අසත්‍යයි. (ඉ) සත්‍යයි. (ඊ) සත්‍යයි.

(iii) (අ) රක්ෂිතයා/ පළමු පක්ෂය - කමල් පෙරේරා
රක්ෂකයා/ දෙවන පක්ෂය - ශ්‍රී ලංකා රක්ෂණ සමාගම **(ල. 02)**

(ආ) උපරිම විශ්වාසය
- රක්ෂණ ගිවිසුමට එළැඹෙන දෙපාර්ශවයටම එම ගිවිසුමට අදාළ සියලුම තොරතුරු නිවැරදිව ඔවුනොවුන්ට හෙළිදරව් කල යුතු බව මෙයින් විස්තර කරයි. **(ල. 01)**

(iv) (අ) ජංගම ගිණුම

(ආ) - චෙක්පත් මඟින් ගනුදෙනු කළහැකිවීම.

- බැංකු අයිරා පහසුකම් ලබාගත හැකිවීම.
- ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම.
- සෘජු ප්‍රේෂණ රැස් කිරීම. **(ල. 01)**

4. (i) සඵලදායකත්වය
අරමුණු අපේක්ෂිත අයුරින් ඉටු කර ගැනීම.

කාර්යක්ෂමතාවය
අවම සම්පත් ප්‍රමාණයකින් උපරිම ප්‍රයෝජන ලැබෙන පරිදි සම්පත් භාවිතා කිරීම.
(ලකුණු 2 යි)

(ii) (අ) අසත්‍යයයි (ආ) සත්‍යයි (ඉ) අසත්‍යයි (ඊ) අසත්‍යයි
(ලකුණු 2 යි)

(iii) A - සැලසුම්කරණය B - මෙහෙයවීම
C - සංවිධානකරණය D - පාලනය
(ලකුණු 2 යි)

(iv) (අ) ආයෝජනයේ අරමුණ
ආයෝජනයේ අවදානම
ආයෝජනයේ ප්‍රතිලාභ **(මෙයින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 01යි)**

(ආ) මිලදී ගත් කොටස් සඳහා ලාභාංශ ආදායම් ලැබිය හැකි වීම
ගත් මිලට වඩා වැඩි වටිනාකමකට විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ ලබා ගත හැකි වීම.
(ලකුණු 1 යි)

5. (i) අතීත ගනුදෙනුවක ප්‍රතිඵලයක් වීම.
බේරුම් කිරීමේදී ව්‍යාපාරයේ සම්පත්වලින් කොටසක් පිටතට ගලායාම.
වර්තමාන බැඳීමක් තිබීම.
(ලකුණු 1 බැගින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 02 යි)

(ii) (අ) වත්කම් (ආ) වියදම් (ඉ) හිමිකම් (ඊ) ආදායම්
(ලකුණු ½ × 4 = ලකුණු 02 යි)

(iii) (අ) 1. රු. 80 000ක බඩු තොගයක් ණයට ගැනීම.
2. රු. 50 000ක් වූ පිරිවැය බඩු තොගයක් රු. 60 000කට ණයට විකිණීම. එහි ලාභය රු. 10 000කි.
(ලකුණු 01×2 = 02 යි)

(ආ) 3. බැංකු ණය ගිණුම හර රු. 90 000
බැංකු ණය පොළී ගිණුම හර රු. 10 000
මුදල් ගිණුම බැර රු. 100 000

4. මුදල් ගිණුම හර රු. 50 000
ණයගැති ගිණුම බැර රු. 50 000
(ලකුණු 01×2 = 02 යි)

(iv) (අ)

දිනය	විස්තරය	ස.පි.	වට්ටම්	මුදල්	දිනය	විස්තරය	ස.පි.	වට්ටම්	මුදල්
2025.01.01	ශේෂය ඉ/ගෙ			120 000	01.08	ණයහිමි- සුපුන්		8 000	72 000
01.02	ගොඩ. කුලී ආදායම්			80 000					
01.12	ණයගැති - හසිත		500	9 500					
01.20	විකුණුම්			100 000	01.31	ශේෂය ප/ගෙ			237 500
			500	309 500				8 000	309 500
02.01	ශේෂය ඉ/ගෙ			237 500					

ශේෂය හැර ඕනෑම අයිතම දෙකකට ½ බැගින් 1½
නිවැරදි ආකෘතියට ½ (ලකුණු 02 යි)

(ආ)

ණය හිමි - සුපුන්

දිනය	විස්තරය	ස.පි.	මුදල්	දිනය	විස්තරය	ස.පි.	මුදල්
2025.01.08	මුදල්		72 000	01.01	ශේෂය ඉ/ගෙ		100 000
	ලද වට්ටම්		8 000				
01.31	ශේෂය ප/ගෙ		20 000				
			100 000				100 000

ණය ගැති - හසිත

දිනය	විස්තරය	ස.පි.	මුදල්	දිනය	විස්තරය	ස.පි.	මුදල්
2025.01.01	ශේෂය ඉ/ගෙ		60 000	01.12	මුදල්		9 500
					දුන් වට්ටම්		500
				01.31	ශේෂය ප/ගෙ		50 000
			60 000				60 000

(ඕනෑම අයිතම දෙකකට ½ බැගින් (ලකුණු 02 යි)

6. (i) තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත්
නිකුත් කළ නමුත් ගෙවීමට බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත්
සෘජු ප්‍රේෂණ
ස්ථාවර නියෝග මත ගෙවීම්
බැංකු ගාස්තු
චෙක්පොත් ගාස්තු

(මෙයින් ඕනෑම කරුණු දෙකකට ලකුණු 02 යි)

(ii) (අ)

	රු.
පරිභෝජනය කළ ද්‍රව්‍ය පිරිවැය	150 000
සෘජු ශ්‍රම පිරිවැය	50 000
නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය	100 000
මුළු නිෂ්පාදන පිරිවැය	300 000

(ලකුණු 1/2)

චොකලට් පැකට් එකක නිෂ්පාදන පිරිවැය = මුළු නිෂ්පාදන පිරිවැය / චොකලට් පැකට් ගණන

= 300 000 / 1 000

= රු. 300.00 **(ලකුණු 1/2)**

(ආ)

චොකලට් පැකට් එකක නිෂ්පාදන පිරිවැය	= රු. 300
ලාභ ආන්තිකය (20%)	= රු. 60
චොකලට් පැකට් එකක විකුණුම් මිල	= රු. 360

$300 \times \frac{20}{100} =$ රු.60. 00

(ලකුණු ½)

(iii) (අ)

පොදු ජ'නලය

දිනය	ව. අං.	විස්තරය	ලෙ.පි.	හර (රු.)	බැර (රු.)
		ණයගැති පාලන ගිණුම හර විකුණුම් ගිණුම (රු.5 000ක විකුණුම් ඉන්වොයිසියේ මහහැරීමේ වරද නිවැරදි කිරීම)		5 000	5 000
		අවිනිශ්චිත ගිණුම හර දුන් වට්ටම් ගිණුම ලද වට්ටම් ගිණුම (ලද වට්ටම් රු.1 000ක් දුන් වට්ටම් ගිණුමට හර කිරීමේ වරද නිවැරදි කිරීම)		2 000	1 000 1 000
		.....(බැ/ණය පොළී) ගිණුම හර අවිනිශ්චිත ගිණුම (රු. 500ක ගෙවූ බැංකු ණය පොළී ගිණුම ශේෂ පිරික්සුමෙන් මහහැරීමේ වරද නිවැරදි කිරීම)		500	500
		ණයහිමි පාලන ගිණුම හර ගැණුම් ගිණුම (රු.5 000ක ණයට ගැණුම් රු. 15 000ක් ලෙස ගැණුම් ජ'නලයේ කිරීමේ සටහන් කිරීමේ වරද නිවැරදි කිරීම)		10 000	10 000

(ලකුණු ½ × 4 = ලකුණු 02 යි)

(ආ)

අවිනිශ්චිත ගිණුම

දිනය	විස්තරය	ස.පි.	වටිනාකම (රු.)	දිනය	විස්තරය	ස.පි.	වටිනාකම (රු.)
	ලද වට්ටම්		(½)1 000		ශේෂ පිරික්සුමේ වෙනස		(½)1 500
	දුන් වට්ටම්		(½)1 000		.....(බැ/ණය පොළී)		(½) 500
			2 000				2 000

(ලකුණු 02 යි)

(iv) (අ)

බැංකු ගිණුම

දිනය	විස්තරය	ස.පි.	වටිනාකම (රු.)	දිනය	විස්තරය	ස.පි.	වටිනාකම (රු.)
	ශේෂය ඉ/ගෙ		(½)20 000		ශේෂ පිරික්සුමේ වෙනස		(½) 500
	ණයගැති ප්‍රේෂණ		(½) 3 000		රක්ෂණ වාරික		(½) 1 000
				05.31	ශේෂය ප/ගෙ		21 500
			23 000				23 000
06.01	ශේෂය ඉ/ගෙ		21 500				

(ලකුණු 02 යි)

(ආ)

රවීෂගේ ව්‍යාපාරයේ

2026.05.31 දිනට බැංකු සැසඳුම් විස්තරය

බැංකු ගිණුමේ සංශෝධිත ශේෂය		(½)21 500
<u>එකතු කළා</u>		
නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත්		
චෙක් අංක 857023	5 000	
චෙක් අංක 857024	2 500	(½)7 500
		29 000
<u>අඩු කළා</u>		
නිකුත් කළ නමුත් ඉදිරිපත් නොකළ චෙක්පත්		
චෙක් අංක 407258	15 000	(½) (15 000)
2026.05.31 දිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය		(½)14 000

(ලකුණු 02 යි)

7. (i)

පොදු ජ'නලය

ලැබිය යුතු පොලී ආදායම් ගිණුම	හර	100 000	
පොලී ආදායම් ගිණුම			100 000
(ලැබිය යුතු පොලිය සටහන් කිරීම.)			

(ල. 1 × 2 = ල. 02)

(ii) (අ) රු. 204 000
(ආ) රු. 240 000 **(ල. 1 × 2 = ල. 02)**

(iii) (අ)

තාරිකා ව්‍යාපාරය ½

2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලාභ හෝ අලාභ ප්‍රකාශනය

	රු.	රු.	රු.	
විකුණුම්			680 000	
අඩුකළා - විකුණුම් පිරිවැය				
2025.01.01 දිනට තොගය		42 000		
එකතු කළා - ගැණුම්		350 000		
විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩ තොගයේ පිරිවැය		392 000		
අඩුකළා - 2025.12.31 දිනට තොගය		(58 000)	½	
විකුණුම් පිරිවැය			(334 000)	
දළ ලාභය			346 000	½
වෙනත් ආදායම්			8 000	
ලද වට්ටම්			354 000	
අඩුකලා - වියදම්				
බෙදාහැරීමේ වියදම්				
බොල්ණය	19 000	½		
බෙදාහැරීමේ රථ ක්ෂය	45 000	½		
දුන් වට්ටම්	9 000	73 000		
පරිපාලන වියදම්				
ගොඩනැගිලි ක්ෂය	60 000	½		
සේවක වැටුප්	28 000	88 000		
මූල්‍ය හා වෙනත් වියදම්				
බැංකු ණය පොළී	8 000	½		
බැංකු ගාස්තු	2 000	10 000	(171 000)	
ශුද්ධ ලාභය ප්‍රාග්ධන ගිණුමට මාරු කලා			183 000	½

(ලකුණු 04)

(ආ)

තාරිකා ව්‍යාපාරය
2025.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

ජංගම නොවන වත්කම්	පිරිවැය(රු.)	සමුච්චිත ක්ෂය(රු.)	ධාරණ අගය (රු.)
ගොඩනැගිලි	600 000	(210 000)½	390 000
බෙදාහැරීමේ රථ	450 000	(120 000)½	330 000
	1 050 000	330 000	720 000
ජංගම වත්කම්			
2025.12.31 දිනට තොගය		58 000	½
ණය ගැතියෝ		51 000	½
මුදල්		8 500	117 500
මුළු වත්කම්			837 500
හිමිකම්			
2025.01.01 දිනට ප්‍රාග්ධනය		530 000	
එකතු කළා - ශුද්ධ ලාභය		½183 000	713 000
ජංගම නොවන වගකීම්			
10% බැංකු ණය			80 000
ජංගම වගකීම්			
ණයහිමියෝ		40 000	
බැංකු අයිරාව		3 000	½
උපචිත බැංකු ණය පොළී		1 500½	44 500
හිමිකම් හා වගකීම්			837 500

(ලකුණු 04)